## තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ රියදුරු පුරප්පාඩු තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවීම

1.0 තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ දැනට පවත්නා රියදුරු පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයක් සඳහා රියදුරන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ප්‍රකාරව 2018.10.05 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 වෘත්තීය පරීක්ෂණයක් සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3.0 තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ දැනට පවතින තාවකාලික ගණයේ කොන්ත්‍රාත් පදනම මත වන රියදුරු පුරප්පාඩු සංඛ්‍යාව 04 කි. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 වැටුප :- කළමනාකරණ සේවා අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අංක DMS/0052 හා 2016.07.18 දිනැති ලිපිය අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 උපලේඛන II පදනම්ව අදාල වැටුප් තලය මසකට රු.20,462 + 4,629 + 7,800 ක් වේ.

5.0 සුදුසුකම්:- රියදුරු තනතුරු වලට (කොන්ත්‍රාත් පදනම) බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ඇ) යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

(ඈ) අධ්‍යාපන සුදුසුකම්
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්වී තිබීම.

(ඉ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්හී V වෙනි පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

( ඊ) වෘත්තීය සුදුසුකම්:-

1. පෞද්ගලික/ කුලී රථ සහ තාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.
(බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් සී සහ සී1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.)

2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

(ඌ) පළපුරුද්ද :-

වාහන රියදුරෙකු වශයෙන් වසර තුනක පළපුරුද්ද තිබිය යුතුය. (පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය.)

(ඍ) කායික සුදුසුකම් :-

අවම උස අඩි 05ක් වියයුතුය.

දිවා කාලයේ සහ රාත්‍රි කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මඟින් ඒ බව සනාථ කළ යුතුය.

සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් **අයදුම්පත් කැඳවන දිනයේ** හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6.0 බඳවා ගැනීමේ ක්‍රමය:

(අ) වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟින්

(ආ) වෘත්තීය පරීක්ෂණය :

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| (I) | රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| (II) | මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| (III) | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

සටහන - තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මඟින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුය.

7.0 ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

8.0 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

8.1 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **" රියදුරු (කොන්ත්‍රාත් පදනම) බඳවා ගැනීම"** යන්න සඳහන් කරන්න.

9.0 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් තිරසර වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් වෘත්තීය පරීක්ෂණයකට හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයට හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

9.1 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරිම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැදුනුම්පත.
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.
iii. වලංගු රියදුරු බලපත්‍රය.

10.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ම.අ. ප්‍රදීප් ඉමල් ගුණවර්ධන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)

අත්/කළේ : පී.එච්.ආනන්ද
ලේකම් (වැ.බ.)
තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය

2018 සැප්තැම්බර් මස ..14.... දින
තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය
අංක 1090,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.